---

**වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව**

**පුත්තලම** දිස්ත්‍රික්කය

---

**1. මූල්‍ය ප්‍රකාශන**

---

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

---

සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මැයි 22 දිනද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 ජුනි 14 දිනද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වරයාගේ වාර්තාව 2013 නොවැම්බර් 07 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 **මතය**

---

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව වෙන්නප්පුව **ප්‍රාදේශීය** සභාවේ , 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිපල හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

---

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

---

(අ) 2001 වර්ෂයේ රු.1,376,770 ක මූල්‍ය වංචාවක් සම්බන්ධයෙන් නිලධාරියෙකුට එරෙහිව පවරා ඇති නඩුව පිළිබඳව අසම්භාව්‍ය වියදම් හෙළිදරව් කර ඒ සඳහා ප්‍රමාණවත් වෙන්කිරීම් ගිණුම්වල දක්වා නොතිබුණි.

(ආ) උප කාර්යාල 05 ක 2012 දෙසැම්බර් 31 දිනට තිබූ රු. 329,793 ක අතැති මුදල් ශේෂ මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැරී තිබුණි.

(ඇ) කිරිමැටියාන ආදාහනාගාරයේ වටිනාකම වූ රු.3,742,247ක් ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම් වලින් අත්හැරී තිබූ අතර පළාත් සභා ප්‍රදානයක් ලෙස

ලැබී තිබූ අංක 28 – 2537 දරණ හිනෝ රථයේ වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) ශේෂ පිරික්ෂුමේ දැක්වෙන ගෙවිය යුතු මුද්දර බදු රු. 140,486 ක් හා සුනාමි ආධාර රු.650,685 ක් ශේෂ පත්‍රයේ ජංගම බැරකම් වලින් අත්හැරී තිබුණි.

(ඉ) හිඟ හිටි ආදායම් වූ රු. 3,042,041 කින් ආදායම් ණයගැතියන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) විවිධ ණය හිමි ශේෂය තුල , ද්විගණනයවීම , අවලංගු කිරීම්, සෘජු ශ්‍රමය මගින් ඉටුකිරීම් හා නොගෙවිය යුතු එකතු කල අගය මත බදු ඇතුලත් කිරීම හේතුවෙන රු.3,919,320 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) විගණනය සඳහා ඉදිරිපත් කල ගිණුම් අනුව සේවක ණය ගිණුමේ ශේෂය රු.7,505,517 ක් වූ අතර, ඉදිරිපත් කරන ලද කේවල ශේෂ ලැයිස්තුව අනුව ශේෂය රු. 5,218,917 ක් විය. ඒඅනුව රු.2,286,600 ක වෙනසක් අනාවරණය විය.එම වෙනස සඳහා හේතු පැහැදිලි කිරීමට සභාව අපොහොසත් විය.

(ඌ) 2012 දෙසැම්බර් මාසයේ බැංකු සැසඳුම් තුල අනාවරණය වූ රු.389,297 ක අවිනිශ්චිත ගිණුම පිළිබඳව පැහැදිලි කිරීම් ඉදිරිපත් කර නොතිබුණි.

**1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම**

---------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.262,240,256 ක්වූ ගණුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

---------------------------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ, පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු.42,600,136 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.50,156,512 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපති වරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. 000' | රු. 000' | රු. 000' |
| (i) වරිපනම් හා බදු | 9,541 | 8,121 | 4,482 |
| (ii) බදු කුලී | 32,662 | 28,175 | 2,229 |
| (iii) බලපත්‍ර ගාස්තු | 7,543 | 6,576 | 48 |
| (iv) වෙනත් ආදායම් | 134,171 | 65,092 | 161,173 |

### 2.2.2 වරිපනම් බදු

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වරිපනම් සඳහා බිල්කරන ලද දේපල 7618 කින් බදු අයකර තිබුනේ දේපල 4727 කින් පමණක් වූ අතර, එය බිල්කල ප්‍රමාණයෙන් 62% ක් විය. සමාලෝචිත වසර අවසානයට වරිපනම් ඒකක 1912 කට අදාල වසරක කාලයක් ඉක්මවා තිබූ හිඟ වරිපනම් බදු ප්‍රමාණය රු. 1,846,045 ක් විය.

### 2.2.3 බදුකුලී

(අ) සමාලෝචිත වසර අවසානයට දේපල ඒකක 14 කට අදාලව වසරක කාලයක් ඉක්මවා තිබූ හිඟ බදු කුලී වටිනාකම රු. 1,957,335 ක් විය.

(ආ) වෙන්නප්පුව වෙළඳ සංකීර්ණයේ ව. අඩි. 4440 කින් යුක්ත උඩුමහල වර්ෂ 2ක කාලයක සිට බදු කුලියකින් තොරව වෙළඳ සංගම් සඳහා පවරා දී තිබුණි.

### 2.2.4 වෙනත් ආදායම්

සභාව විසින් ත්‍රිරෝද හා වෑන් රථ ගාල් ලියාපදිංචි කිරීමෙන් හා වෙන්නප්පුව බස් නැවතුම්පල ගාස්තු ද අයකර ගැනීමෙන් ආදායම් ඉපයීමට ක්‍රියාකර නොතිබුණි.

**2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම් වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබු මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 6,491,943 |
| (ii) | මුද්දර ගාස්තු | 153,906,250 |

**2.3 අධිභාර**

**1987 අංක 15 දරන** ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිවයුතු අයවලුන්ට එරෙහිව මා විසින් ඉකුත් වර්ෂයන් තුල පනවන ලද අධිභාර සම්බන්ධයෙන් 2012 දෙසැම්බර් 31 දිනට රු. 326,335 ක මුදලක් අයකර ගැනීමට තිබුණි.

**2.4 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත භෞතික සම්පත්**

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) වයඹ පළාත් සභාව විසින් පරිත්‍යාගයක් ලෙස ලබාදී තිබු අංක 28- 2537 දරණ හීනෝ රථය ප්‍රයෝජනයට ගත නොහැකිව අබලි තත්ත්වයෙන් 1997 වර්ෂයේ සිට වෙන්නප්පුව උසාවි භූමියේ ගාල්කර තිබුණි.

(ආ) රු. 5,649,080 ක් වටිනා ගිනි නිවන රථය සමාලෝචිත වර්ෂයේ සිටද රු. 43,806 ක් වටිනා කේ.75 වර්ගයේ රෝද දෙකේ ට්‍රැක්ටරය වර්ෂ කිපයක සිටද අක්‍රියව ප්‍රධාන කාර්යාල භූමියේ ගාල්කර තිබුණි.

(ඇ) රු.299,126 ක් වටිනා රෝද දෙකේ ට්‍රැක්ටර් 3 ක්ද, වටිනාකම අනාවරණය නොවු අංක රහිත රෝද දෙකේ ට්‍රැක්ටරයයක් හා පරිත්‍යාග ලෙස ලැබි තිබු තාර ඉසින යන්ත්‍රයක්ද, කිරිමැටියාන උප කාර්යාල භූමියේ වසර කිපයක සිට ගාල්කර තිබුණි.

**2.5 කොන්ත්‍රාත් පරිපාලනය**

පහත නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුලදී අයවැය ලේඛනය අනුව කර්මාන්ත 220 ක් ඉටුකිරීමට සැලසුම් කලද ඉන් 146 ක් ඉටුකර නොතිබු අතර, නිමකල කර්මාන්ත සංඛ්‍යාව 74 ක් විය.

(ආ) මහනැගුම සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මාර්ග 10 ක කොන්ක්‍රිට් ගල් ඇතිරිම සඳහා රු.10,000,000 ක් ලබාදි තිබුණි. 2012 දෙසැම්බර් 31 දිනට අදාල මාර්ග 10 න් ඉදිකිරිම් නිමකර තිබුනේ රු. 3,000,000 ක් වටිනා මාර්ග 03 ක් පමණි. ඉතිරි ඉදිකිරිම් වල භෞතික ප්‍රගතිය සියයට 10 ක් විය.

(ඇ) " ගැමි අරුණළු " වැඩ සටහන් යටතේ රු. 100,000 බැගින් වු ව්‍යාපෘති 99 ක් නිම කිරිමට සැලසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂය සඳහා ඉටුකිරිමට තෝරාගෙන තිබුනේ රු.2,766,000 ක් වටිනා ව්‍යාපෘති 20 ක් පමණි. නිමකර තිබු ව්‍යාපෘති සංඛ්‍යාව 7 ක් වු අතර, ඒ අනුව වැඩ සටහනේ ප්‍රගතිය සියයට 7 ක් විය.

(ඈ) සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තු සකස් කල කර්මාන්ත 141 න් එම වසරේදී නිමකර තිබු සංඛ්‍යාව කර්මාන්ත 74 ක් වු අතර, ඉතිරි 67 අවිච්ඡේද වී තිබුණි.

2.6 සිරිගම්පල ක්‍රිඩාපිටිය සංවර්ධනය කිරිම.
-------------------------------------------

2013 ජුලි මාසයේදි කරන ලද භෞතික පරික්ෂාවේදි පහත කරුණු අනාවරණය විය.

(අ) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු වූ යෝජිත ක්‍රිඩාපිටිය පිහිටි භූමිය සභාව විසින් පවරා ගැනීමෙන්තොරව ඒ සඳහා වූ කොන්ත්‍රාත්තුව රු. 10,000,000 කට සිරිගම්පල සමෘද්ධි බලකාය වෙත ප්‍රදානය කර තිබුණි.

(ආ) අදාල භූමිය පහත් බිමක් වුයෙන් ජලය රැදි තිබෙනු දක්නට ලැබුණි. ප්‍රදේශයේ වැසි ජලය රැස්වන ස්ථානය එය බැවින් වැසි ජලය බැස යාමට විධිමත් කාණු පද්ධතියක් සකස් නොකර එම භූමිය ගොඩ කිරිමෙන් එම ප්‍රදේශය මෙන්ම ක්‍රිඩාපිටියද වැසි ජලයෙන් යටවීමේ අවදානමක් පවති.

(ඇ) අදාල සමෘද්ධි බලකාය එම කර්මාන්තය ඉටු නොකරන බව සනාථ කර තිබු අතර, වෙනත් පුද්ගලයින් විසින් කර්මාන්තය ඉටුකර තිබුණි.

2.7 මෙහෙයුම් අකාර්යක්ෂමතා
------------------------------------

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) ඉඩම් කට්ටිකර විකිණීමේදි පොදු පහසුකම් වෙනුවෙන් සභාවට ලබාදි තිබූ ඉඩම් කට්ටි සමීක්ෂණ මණ්ඩලයක් මගින් සමීක්ෂණය කර අයිතිය තහවුරු කරගෙන ආරක්ෂා කර ගැනීමට ක්‍රියාකර නොතිබුණි.

(ආ) වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

3. **පද්ධති හා පාලන**

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි තවදුරටත් සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) කොන්ත්‍රාත් පාලනය
(ඉ) ණයගැති හා ණයහිමි පාලනය
(ඊ) වත්කම් කළමනාකරණය